සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.09

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre
53207
De Mazenod College
Kandana

# වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
# ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
# Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 07
විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය
පත්‍රය / வினாத்தாள் / Paper: I, II
කාලය / காலம் / Time: පැය 02 යි

නම / பெயர் / Name: ..............................
විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: ..............................

සැලකිය යුතුයි

- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

---

## I කොටස

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජාතික කොඩියේ වම් පස කොළ හා කහ පැහැති තීරුවෙන් නියෝජනය වන්නේ,
    1. ජාතීන් අතර එකමුතු බවයි.
    2. කහ තීරුවෙන් දෙමළ ජනවර්ගය හා කොළ තීරුවෙන් මුස්ලිම් ජනවර්ගය නියෝජනය වේ.
    3. කහ තීරුවෙන් මුස්ලිම් ජනවර්ගය නියෝජනය වේ.
    4. රට වැසියන් අතර සමානාත්මතාව පිළිබිඹුවේ.

02. ජාතික කොඩිය එසවීමේදී අනුගමනය කළ යුතු රීතියක් වන්නේ,
    1. එසවීම හා පහත් කිරීම සෙමෙන් හා ගෞරවාන්විතව සිදු කිරීම.
    2. හානි වූ හා අවලක්ෂණ කොඩි භාවිත කිරීම.
    3. සිංහයා උඩු යටිකුරු කර ප්‍රදර්ශණය කිරීම.
    4. අඳින ඇඳුමක් ඇතිරිල්ලක් ලෙස භාවිත කිරීම.

03. න්‍යෂ්ටික පවුලට වඩා සාපේක්ෂව විස්තෘත පවුලේ විශේෂත්වය වන්නේ.
    1. පවුලේ සාමාජික සංඛ්‍යාව අඩුය.
    2. පවුලේ ආර්ථික කටයුතු සඳහා දායකත්වය අඩුය.
    3. ආරක්ෂාව හා සෙනෙහස නොලැබීම.
    4. පවුලේ උසස් ගුණාංග බාල පරපුරට කුඩා කළ සිට හුරු පුහුරු වීම.

04. විවේකය ඵලදායි ලෙස ගත කරගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ,
    1. ක්‍රීඩා වල යෙදීම සුදුසු ය.
    2. මිතුරන් සමග ගමන් බිමන් යාම සුදුසු ය.
    3. පාසල් මිතුරන් සමග කල්ගත කිරීම සුදුසු ය.
    4. අසල් වැසියන් සමග අල්ලාප සල්ලාප වල යෙදීම සුදුසු ය.

05. ඔබගේ පියාගේ අයියාගේ බිරිඳ ඔබේ,
    1. ලොකු අම්මා / මහම්මා ය.
    2. ලොකු අම්මා / නැන්දා ය.
    3. පුංචි අම්මා / කුඩම්මා ය.
    4. නැනා / පුංචි අම්මා ය.

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රකාශන හරිනම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. සමාජයේ යහපැවැත්ම සඳහා පුරවැසියන් තමන්ට පැවරෙන කාර්යයන් ඉටුකිරීම යුතුකම් ලෙස අර්ථවත් වේ. (............)
07. තෛපොංගල් උත්සවය සමරන්නේ ඉස්ලාම් බැතිමතුන් විසිනි. (............)
08. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නුග ගසයි. (............)
09. විනය ගරුක බව පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු සාරධර්මයකි. (............)
10. අයහපත් චිත්තවේග තත්වයන් පාලනය කර ගැනීම සඳහා ආගමික කටයුතු වල යෙදීම වැදගත් වේ (............)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

11. බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේදී භාණ්ඩ මිලදී ගන්නා විට .............................. පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
12. පවුල් ඒකකය තුළ ඥාති .............................. පවත්වාගෙන යාම නිසා සාමාජිකයන්ට ප්‍රයෝජන රාශියක් අත් වේ.
13. රාජ්‍ය ලාංඡනයේ තිබෙන වී කරල් මගින් .............................. සංකේතවත් වේ.
14. .............................. මත ගොඩනැගී තිබීම පවුලක් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි.
15. ජීවන අභියෝග ජයගැනීමට .............................. කටයුතු කළ යුතුය.
(සම්බන්ධතා, සිරිත් විරිත්, ගුණාත්මක භාවය, සෞභාග්‍යය, ඥාතීත්වය, සහෝදරත්වය, නිර්මාණශීලීව)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට සුදුසු නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

16. පුද්ගලයා තුළ විවිධ අවස්ථාවන්වල ඇතිවන සිතුවිලි හා හැඟීම් .............................. ලෙස හැඳින්වේ.
17. ජාතික පක්ෂියා ලෙස නම් කර ඇත්තේ .............................. ය.
18. පුස්තකාලය ජන සමාජයේ .............................. හේතුවන ආයතනයකි.
19. අපේ ආහාර අවශ්‍යතා ඉටුකරගැනීමට අවශ්‍ය බොහොමයක් .............................. ආශ්‍රිත ක්ෂේත්‍ර වලින් සැපයේ.
20. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෘත්තිකයන්ගේ .............................. සුරැකීම සඳහා නීති රීති රැසක් ක්‍රියාත්මක වේ.

2024 . 02 . 09 G . 07

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනික් එක් එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. i. පවුලක සාමාජිකයෙකු ලෙස ජීවත්වීම නිසා ඔබට අත්වන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න.
ii. සෞන්දර්යාත්මක ක්‍රියාකරකම් වල යෙදීම නිසා ඇතිවන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
iii. පුද්ගලයා තුළ ඇතිවන චිත්තාවේග දෙකක් සඳහන් කරන්න.
iv. වර්තමාන පවුල් ඒකක මුහුණපාන අභියෝග දෙකක් නම් කරන්න.
v. පවුල තුළ පවතින සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් දෙකක් සඳහන් කරන්න.
vi. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන දෛනිකව අපට අවශ්‍ය තොරතුරු දෙකක් නම් කරන්න.
vii. සංස්කෘතික අංග දෙකක් ලියා දක්වන්න.
viii. ජාතික ගීය ගායනා කරන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2x8=16)

02. i. සංස්කෘතික විවිධත්වයට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. කතෝලික ආගම හා බැඳුණු උත්සව හතරක් නම් කරන්න. (ලකුණු 4)
iii. පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු සාරධර්ම පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

03. i. වර්තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක ඒවායේ සාමාජිකත්වය අනුව බෙදා වෙන්කරනු ලබන වර්ග දෙක නම් කරන්න. (ලකුණු 2)
ii. පාසල් සිසුවකු වශයෙන් විභාගය හොඳින් සමත්වීමට ඔබ විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
iii. විවේකය ගත කිරීම සඳහා හොඳ මාධ්‍ය වැඩසටහන් පරිහරණය කිරීම වැදගත් වේ. ඔබ තැරඟූ හොඳ රූපවාහිනී වැඩසටහන් පහක් නම් කරන්න. (ලකුණු 5)

04. i. ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා දෙකක් නම් කරන්න. (ලකුණු 2)
ii. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)
iii. යහපත් පුරවැසියකු සතු ගුණාංග පහක් ලියන්න. (ලකුණු 5)

05. i. ඔබගෙන් පවුලේ සාමාජිකයන්ට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)
ii. අසල්වාසීන් සමඟ සුහදව කටයුතු කරන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු 4)
iii. අසල්වාසීන් සමඟ සුහදව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

06. i. ජන සමාජයක පුද්ගලයාට හිමි අයිතිවාසිකම් බෙදනු ලබන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2)
ii. අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් හතරක් සඳහන් කරන්න. ලකුණු 4)
iii. ජන සමාජයේ යහපත් පුද්ගලයකු ලෙස ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

07. i. සංස්කෘතික විවිධත්වයට හේතු දෙකක් ලියන්න. (ලකුණු 2)
ii. ශ්‍රී ලංකාවේ වෙසෙන ජන වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 4)
iii. සංස්කෘතික දායාද ආරක්ෂාකර ගැනීම සඳහා පුරවැසියකු වශයෙන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5)